# <u>ව්‍යාපෘති අධීක්ෂණ වාර්තාව (2017/05/23 දිනට)</u>

(එක් ව්‍යාපෘතියක් සඳහා එක් වාර්තාවක් බැගින්)

1. අධීක්ෂණය කළ නිලධාරියාගේ නම : දිලූපා එන්. අඹේපිටිය මිය/ ඒ.සී.පී. ධර්මදාස මිය/ කේ.කේ. අග්‍රා ඉරෝෂිණී මිය

2. තනතුර : සහකාර අධ්‍යක්ෂ (මෙහෙයුම් හා ඇගයුම්)/ සංවර්ධන නිලධාරී (මෙහෙයුම් හා ඇගයුම්)/ සංවර්ධන නිලධාරී (මෙහෙයුම් හා ඇගයුම්)

3. ව්‍යාපෘතිය අධීක්ෂණය කල දිනය : 2017/05/23

4. අධීක්ෂණය කළ ව්‍යාපෘතිය
   - අයත් පළාත : දකුණු පළාත
   - දිස්ත්‍රික්කය : ගාල්ල
   - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ඉමදූව
   - ගොවිජන සේවා මධ්‍යස්ථානය : කෝදාගොඩ
   - කෘ.ප.නි.ස වසම : 170 A ඇල්ලලගොඩ

5. අධීක්ෂණය කළ ව්‍යාපෘතිය : ගෙවතු වගා වැඩසටහන

6. අධීක්ෂණය කළ ව්‍යාපෘතිය අයත් ආයතනය : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
   - ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම : 2016 වර්ෂය සඳහා රු.මි. 226.725 ක ප්‍රතිපාදන වෙන්වී ඇත.
   - ව්‍යාපෘතිය සඳහා වැයකර ඇති මුදල : 2016.12.31 දිනට රු . මිලි . 151.189 ක් වියදම් කර ඇත.
     දිස්ත්‍රික්කයට අදාලව සමස්ත වියදම රු.ලක්ෂ 2,215,864.00 කි.

| අධීක්ෂණය කල ක්‍රියාකාරකම් (ක්‍රියාකාරි සැලැස්මට අනුව) | ක්‍රියාකාරකම ආරම්භකළ දිනය | වර්තමාන තත්ත්වය (ප්‍රගතිය) | නිරීක්ෂණය කළ සුවිශේෂී කරුණු | එක් එක් ක්‍රියාකාරකම සඳහා වගකිව යුතු නිලධාරියා |
|---|---|---|---|---|
| ගෙවතු වගා වැඩසටහන යටතේ සිතමු කාන්තා ගොවි සංවිධානය හරහා ලබා දී ඇති පැළවල වර්තමාන තත්ත්වය නිරීක්ෂණය කිරීම. (කෘ.ප.නි.ස වසම - 170 A ඇල්ලලගොඩ) | පැළ ලබා දී ඇත්තේ - 2016 නොවැම්බර් මස | • පල්ලෙඅද්දර කඩේ, ඇල්ලලගොඩ, ඉමදූව ලිපිනයෙහි පදිංචි ආර්.ඩී. විජේගුණසිංහ මහත්මියට ලබාදී තිබූ පැළවර්ග සහ එළවළු බීජ කට්ටල සාර්ථක ලෙස වගාකර ඇති බව නිරීක්ෂණය විය.<br>• ලබා දී තිබූ එළවළු බීජවලින්, මිරිස්/ වම්බටු/ බණ්ඩක්කා/ වැටකොළු සාර්ථක ලෙස පැළවී ඇත. ඒවායේ එළදාව නෙලාගෙන පරිභෝජනයට ගෙනඇති බවත් එළදාව අලෙවි කරඇති බවත් නිරීක්ෂණය විය.<br>• උගුරැස්ස පලතුරු පැළයක් ලැබී එය සාර්ථක ලෙස වගාකර තිබූ අයුරු නිරීක්ෂණය විය. | • සිය ගෙවත්තෙහිම පොහොර සකසාගෙන පැළවලට යොදනු ලබයි.<br>• නියඟය හේතුවෙන් අලුතෙන් පැළ වගා කිරීමට නොහැකි බව දන්වා සිටියි.<br>• සිතමු ගොවි කාන්තා සමිතිය යටතේ මෙම වසමෙහි ආරම්භ කළ ලියවරුණ කාන්තා ගොවි සමිතියේ සභාපති (0779812764) වේ. සමිතිය යටතේ යෝගට් හා කොස් කොත්තු සෑදීමට පුහුණුවීම් ලබාගෙන ඇත. | 1. කාංචනා චතුරානි මිය, සහකාර කොමසාරිස්, ගාල්ල. 0710881943<br><br>2. ඩබ්.ජී. ඉන්දික මයා, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර (170 A ඇල්ලලගොඩ) 0718106594 |
| | පැළ ලබා දී ඇත්තේ - 2016 නොවැම්බර් මස | • වික්‍රමගෙවත්ත, ඇල්ලලගොඩ, ඉමදූව ලිපිනයෙහි පදිංචි කේ.ඩබ්. ලීලාවතී මහත්මියට ලබාදී තිබූ බණ්ඩක්කා/ ගොටුකොළ/ පතෝල/ වම්බටු/ කතුරුමුරුංගා පැළ සහ එළවළු බීජ කට්ටල | • කොම්පෝස්ට් පොහොර ගෙවත්තෙහිම සකසා ගනී.<br>• එළවළු සහ පලතුරු ඔවුන්ගේ පරිභෝජනයට මෙන්ම අලෙවිකිරීම ද කරනු ලබයි.<br>• ගෙවතු වගාව සඳහා මුල්ලුවක් | |

| | | | | |
|---|---|---|---|---|
| | | සාර්ථක ලෙස වගාකර ඇති බව නිරීක්ෂණය විය.<br><br> දූරියන්/ පැණි දොඩම් හා දෙළුම් වැනි පලතුරු පැළ වර්ග ද සාර්ථක ලෙස වගාකර තිබූ අයුරු නිරීක්ෂණය විය. | ලැබී ඇති බව පවසනු ලැබීය.<br><br> මැය සිතමු ගොවි කාන්තා සමිතිය යටතේ මෙම වසමෙහි ආරම්භ කළ ලියවරුණ කාන්තා ගොවි සමිතියේ උප සභාපති (0915789237) වේ. | |
| | පැළ ලබා දී ඇත්තේ - 2016 නොවැම්බර් මස | කනත්ත ගෙවත්ත, ඇල්ලලගොඩ, ඉමදූව ලිපිනයෙහි පදිංචි ආර්.ජී. මධුෂානි මහත්මියට ලබාදී තිබූ වම්බටු/ මිරිස් පැළ සහ එළවළු බීජ කට්ටල පලා වර්ග සාර්ථක ලෙස වගාකර ඇති බව නිරීක්ෂණය විය.<br><br> උගුරැස්ස/ ජමනාරං හා අනෝදා වැනි පලතුරු පැළ වර්ග ද සාර්ථක ලෙස වගාකර තිබූ අයුරු නිරීක්ෂණය විය. | කොම්පොස්ට් පොහොර ගෙවත්තෙහිම සකසා ගනී.<br><br> මල් පෝච්චි/ හොර්ස් එකක් සහ මුල්ලුවක් ලැබී ඒවායින් ප්‍රයෝජන ලබාගත් බව ද පවසනු ලැබීය.<br><br> සිතමු ගොවි කාන්තා සමිතිය යටතේ මෙම වසමෙහි ආරම්භ කළ ලියවරුණ කාන්තා ගොවි සමිතියේ සමාජිකාවක් ද වේ. සමිතිය යටතේ යෝගට් හා කොස් කොත්තු සෑදීමට පුහුණුවීම් ලබාගෙන ඇත.<br><br> වගා කිරීමට දැඩි උනන්දුවක් හා කැමැත්තක් ඇති බවත් දැකගත හැකි විය. | 1. කාංචනා චතුරානි මිය, සහකාර කොමසාරිස්, ගාල්ල. 0710881943<br><br>2. ඩබ්.ජී. ඉන්දික මයා, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර (170 A ඇල්ලලගොඩ) 0718106594 |

# ගෙවතු වගා වැඩසටහන

*ගාල්ල - ඉමදූව - කෝදාගොඩ වසමේ ක්ෂේත්‍ර අධීක්ෂණය*














කෝදාගොඩ ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් 170 A ඇල්ලලගොඩ වසමෙහි පිහිටි **ආර්.ඩී. විජේගුණසිංහ මහත්මියගේ** ගෙවත්තෙහි එළවළු සාර්ථක ලෙස වගාකර ඇති අයුරු.....



බටු වගාව



එළවළු වගාවන්





මිරිස් වගාව



ගෝවා, බටු හා ලීක්ස් වගාවන්

කෝදාගොඩ ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් 170 A ඇල්ලලගොඩ වසමෙහි පිහිටි **කේ.ඩබ්. ලීලාවතී මහත්මියගේ** ගෙවත්තෙහි එළවළු වගාව, සිය භූමියෙහි හා පොලිතින් උර තුළ සාර්ථක ලෙස වගා කරඇති අයුරු......



මිරිස්, කංකුන් හා තම්පලා වගාවන්





නිවිති වගාව



කොච්චි වගාව

කෝදාගොඩ ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් 170 A ඇල්ලලගොඩ වසමෙහි පිහිටි **ආර්.ජී. මධුෂානි මහත්මියගේ** සිය ගෙවත්තෙහි එළවළු සාර්ථක ලෙස වගාකර ඇති අයුරු.....



කාබනික පොහොර ඒකකය

කෝදාගොඩ ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් 170 A ඇල්ලලගොඩ වසමෙහි පිහිටි **ආර්.ජී. මධුෂානි මහත්මියගේ** ගෙවත්තෙහි කාබනික පොහොර සකස්කර ගැනීමට නිර්මාණය කරගෙනඇති කොම්පෝස්ට් වළක්......

7. නිරීක්ෂණය කල සුවිශේෂී කරුණු සම්බන්ධයෙන් ඔබගේ අදහස් :

- එක් ප්‍රතිලාභී ගෙවත්තකට රු . 550/- ක් වටිනා පලතුරු පැළ 5ක් (රු . 180/- ක් වටිනා අඹ/ දොඩම්/ රඹුටන්/ දූරියන්/ නාරං/ පෙයාරිස්/ කොස්/ මැගුස්ටින් යන බද්ධ පැළවලින් 1 ක් ද රු . 135/- ක් වටිනා අලිපේර/ අනෝදා/ බෙලි/ ගොරකා/ පේර/ ජම්බෝල/ ජම්බු/ ලොවි/ සැපදිල්ලා/ කාමරංකා/ දිවුල්/ උගුරැස්ස යන බද්ධ පැළවලින් 2 ක් ද රු . 50/- ක් වටිනා ගඩිගුඩා/ ෆැෂන් ෆෲට්/ පේර/ කොස්/ ජම්බු/ දෙහි/ දෙළුම්/ දොඩම් යන බීජ පැළවලින් 2 ක් ද) සහ එළවළු බීජ කට්ටලයක් ලබාදිය යුතුව තිබුණත් ප්‍රතිලාභීන් වෙත ඒවා ලබාදී නොමැති බව නිරීක්ෂණය විය.

- ගෙවතු වගාව සඳහා භූමියේ ඉඩ පහසුව හා අමතර භූමි පහසුකම් ද පවතින බැවින් ඔවුන්ට ලබාදුන් පැළවලට අමතරව පැළ ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටි අතර එලෙස පැළ ලබාදීම තුළින් ගෙවතු වගාව පිළිබඳ උනන්දුව වැඩි කිරීමට හැකි වේ.

- ඇය සිතමු ගොවි කාන්තා සමිතියෙහි සමාජිකයෙක් වීම හේතුවෙන් වගාවන් සඳහා ඔවුන්ට සහනාධාර ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටි අතර එලෙස දිරි ගැන්වීමක් කළහැකි වේනම් ගෙවතු වගාව වැඩසටහන වඩාත් සාර්ථක කරගත හැකි වේ.

- කාබනික පොහොර පමණක් මෙම පැළවලට යොදන බැවින් ඵලදාව ලබාගැනීම සඳහා විශේෂිත වූ පොහොර වර්ග ඇත්නම් ඒවා ලබාගැනීමට ක්‍රමවේදයක් සකස්කර දෙන දන්වා සිටි අතර සහන මිලකට හෝ පොහොර ලබාදීමේ වැඩ පිළිවෙළක් සකස්කර ගතහැකිනම් වගාවන්වල අස්වැන්න සාර්ථක ලෙස ලබාගැනීමට හැකිවනු ඇත.

- සතුන්ගෙන් වන හානි වළකා ගැනීමට රැකවරණ දැල්/ මල් බල්දියක්/ වතුර මෝටරයක්/ හොර්ස් එකක් වැනි ගෙවතු වගාව සඳහා අත්‍යවශ්‍ය උපකරණ ලබාදීමට කටයුතු කරන්නේනම් ගෙවතු වගාවන් කරගෙනයාම පහසුවීම.

- වගාවන් සම්බන්ධ පුහුණුවීම් හා දැන්වත්කිරීම් සඳහා වැඩිඉඩකඩක් ලබාදීම තුළින් ඔවුන්ගේ කෘෂි දැනුම තවදුරටත් වැඩිදියුණු කළහැකි වීම.

- අළුතින් හඳුනාගන්නා තාක්ෂණය සහ ඉහළ අස්වැන්නක් සහිත නව ප්‍රභේද හඳුන්වාදීම කළ යුතුව ඇත.

8. අදාළ කරුණු සම්බන්ධයෙන් වන ඔබගේ නිර්දේශ :

නිරන්තර ක්ෂේත්‍ර අධීක්ෂණයට ලක්කිරීම වැදගත්ය.

9. මා.නි. උපදෙස් හා නිර්දේශ :

.............................................................................
ක්ෂේත්‍රය අධීක්ෂණය කළ
නිලධාරියාගේ අත්සන

.............................................................................
දිලූපා එන්. අඹේපිටිය
සහකාර අධ්‍යක්ෂ(මෙහෙයුම් හා ඇගයුම්)
කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

.............................................................................
එන්.පී.වී.සී. පියතිලක
අතිරේක ලේකම්(මෙහෙයුම් හා ඇගයුම්)
කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට